## British woman accused of wrong reporting



The Sri Lanka government is said to have initiated legal proceedings against a young British woman identified as Thamilvany Gnanakumar on the charge of supplying incorrect information from Mullaitivu's **'no fire zone'** to Britain and other countries, 'Divaina' newspaper's Kirthi Warnakulasuriya writes.

under the pseudonym '**Vanikumar**' she had reported that Sri Lankan armed forces were committing genocide against Tamils. She had arrived in the island in 2008 and got her visa extended for eight months before leaving for Kilinochchi and from there to Mullaitivu's **'no fire zone.'** Divaina newspaper reports.

She had supplied false information by using a satellite phone from an LTTE camp. After she had been exposed, the British relatives of Thamilvany have sought support of international organizations to rescue her, the newspaper added.

## A Tribute to my dear friend Dennis

It is hard to believe that you have gone, leaving us in sorrow.

You were a truly great character, full of life with fun and joy, a great fun to be with, never a dull moment when you were around.

You made us laugh, with your wicked jokes, brought sunshine to our lives, with your cheeky smile and mischievous ways.

You entertained us with your great Baila singing and guitar play, and we enjoyed singing and dancing to them, wherever you played.

You did like a good drink, only the very best whiskey on the rocks, and we enjoyed having a drink with you.

You, a great patriot and made an invaluable contribution to the Sri Lankan life in the UK, sponsored and funded very generously charitable causes in Sri Lanka, setting up English Classes for kids in your home town in Sri Lanka helping those less fortunate than you were.

It is a terrible tragedy that fate has taken you away from your loved ones, family and friends, at a relatively young age of your life.

We will miss you very sorely, all that fun, that cheeky smile, wicked jokes, having a drink and a laugh.

Thank you for the wonderful memories you have left behind.

Although you have left us, you will always remain very dearly in our hearts.

**Rest In Peace my dear friend!**

**Gerald Alwis & daughter**
**Dr. Anoushka**

## Obituary අවමංගලය

## Mr Dennis Peries ඩෙනිස් පීරිස් මහතා



**A singer, musician and entertainer, a popular friend among the Sri Lankan community in the UK, Mr Dennis Peiris passed away on 2nd May 2009.**

**The funeral took place at Kingston Cometery after the service at Worcester Park's St. Matthias R.C Church on 20th May 2009.**

**May He Rest in Peace!**

## සිවිල් වැසියන්ගේ ආහාර සඳහා මසකට ඩොලර් මිලියන 5 කි

උතුරු පළාතේ ක්‍රියාත්මක වූ යුද ගැටුම් නිසා අවතැන්ව කඳවුරුවල සිටින සිවිල් වැසියන්ට ආහාර ලබාදීමට මසකට ඇමරිකානු ඩොලර් මිලියන 5 ක් වැයවන බව ලෝක ආහාර වැඩ සටහන පවසයි. අවතැන් වූවන්ට මේ වසර තුළදී කිසිදු ගැටළුවක් නැතිව ආහාර ලබාදීමට තවත් ඇමරිකානු ඩොලර් මිලියන 35 ක් අවශ්‍ය වන බවද ආධාර ලබාදෙන රටවල් පිළිබඳ නවතම වාර්තාව ඉදිරිපත් කරමින් ලෝක ආහාර වැඩසටහන පෙන්වා දෙයි.

අවතැන් වූවන් මේ වන විට රැඳී සිටින තාවකාලික නිවාස වල රැඳී සිටියත් ඔවුන් නැවත පදිංචි කළත් ලබන වසරේ මැයි ජූනි මාස වන තෙක් ඔවුන්ට අවශ්‍ය ආහාර ලබා දිය යුතුව ඇත. ඒ සඳහා අවශ්‍ය ආධාර ලබා දෙන රටවල් වහාම ඒ ආධාර නොපමාව දිය යුතු බවද එම වැඩ සටහන වැඩිදුරටත් කියයි.

## කොටි නඩුකාරයෙකුත් සිවිල් වැසියන් අතර සිට අසුවෙයි

වව්නියාවේ සුබසාධක කඳවුරක සිවිල් ජනතාව සමග සැඟව සිටි ඊනියා කොටි අධිකරණයේ මහේස්ත්‍රාත්වරයෙකු ලෙස කටයුතු කළ පුද්ගලයෙකු අත් අඩංගුවට ගැනීමට ආරක්ෂක අංශ සමත්ව ඇත. ඔහුගේ පාදයක් නැත. ඊට හේතුව ඔහු එල්ටීටීඊ සන්නද්ධ බලකායේ ඉදිරි ආරක්ෂක වළල්ලේ හිඳ සටන් කරද්දී හමුදා වෙඩි පහරකට ලක්වීමයි.

පාදයක් අහිමි වීමෙන් පසු තමා එල්ටීටීඊ නීති අංශයට යොමු කර වසර දෙකක පුහුණුවක් ලබා දීමෙන් අනතුරුව මහේස්ත්‍රාත් වරයෙකු ලෙස පත් කළ බව ඔහු කියා ඇත. එලෙස විනිසුරුවරු හා ඊළාම් නීතිඥවරු ලෙස කටයුතු කළ තවත් කොටි සාමාජිකයන් සුබසාධන කඳවුරුවල රැඳී සිටින බවට තොරතුරු ලැබී ඇතැයි ආරක්ෂක අංශ පවසයි.

## කොටින්ගේ ආයුධ තවත් ඇත

මුලතිව් ප්‍රදේශයේ තවමත් සෝදිසි මෙහෙයුම් වල යෙදී සිටින **53, 57, 58** සේනාංකවල සෙබළුන්ට කොටි ත්‍රස්තවාදීන් විසින් සඟවා තබන ලද පතරොම් දෙලක්ෂයකට අධික සංඛ්‍යාවක් සමග පුපුරණ ද්‍රව්‍ය රාශියක් සොයා ගන්නට හැකිව ඇත. එම පතරොම් සහ උණ්ඩ පිස්තෝල ඇතුළු විවිධ ගිනි අවි සහ සඳහා යොදා ගන්නා ඒවා වන අතර විශාල තුවක්කු හා මෝටාර් සඳහා යොදා ගන්නා උණ්ඩද, ක්ලේමෝ බෝම්බද, අධි බල පුපුරණ ද්‍රව්‍යයද අසු වූ බව කියති. මෙම සෝදිසි මෙහෙයුමේදී එම ප්‍රදේශයේ එල්ටීටීඊ මර උගුල් ඉවත්කරමින් සිටි හමුදා භටයන් දෙදෙනෙකු නොබෝදා තුවාල ලබා ඇත.

♦ *විනිතා එස්. ගමගේ Sri Lanka*

## ♥ පැටියෝ ඩාලිං



" පැටියො ලංකාවෙ ත්‍රස්තවාදෙ නම් ඉවරෙටම ඉවරයි. ආයි කිසිදාක එහේ කොටිනැටුම් බෑ."

" මට කණගාටු මේ එංගලන්තෙ ගැන"

" ඒ මොකද ? "

" කොටි විතරක් නෙවෙයි ලෝකෙ ඉන්න සේරම ත්‍රස්තවාදියො ටික දැන් මෙහේ "

## Sinhala Lesson 133 සිංහල පාඩම

### සිංහල ඉගෙනීමට පහසු මගක් !


### The Infinitive - 'to do' 'කරන්නට '

When we want to say **' to do',** an action other than the final action, the verb form - called **'the infinitive'** is used. These verb forms are made by adding the suffix 'අන්නට ' to the verb base and by adding the suffix 'ට' to the gerund or verbal noun.

1. බල + අන්නට = බලන්නට → **to look**
   සිත + අන්නට = සිතන්නට → **to think**
   කිය + අන්නට = කියන්නට → **to say**
   කප + අන්නට = කපන්නට → **to cut**
   දුව + අන්නට = දුවන්නට → **to run**
   අඬ + අන්නට = අඬන්නට → **to cry**
2. **(Gerund)** කිරීම + ට = කිරීමට → **to do**
3. **Making sentences**
   මම පාඩම් කරන්නට / කිරීමට පටන්ගන්නෙමි
   I will start to study / studying
   මල්ලි සෙල්ලම් කරන්නට / කිරීමට ගියේය
   අපි වත්ත පිරිසිදු කරන්නට / කිරීමට යන්නෙමු
   ගංවතුර ගලන්නට / ගැලීමට පටන්ගත්තේය
3. **Make sentences using these Infinitives:**
   ඇවිදින්නට කියවන්නට පීනන්නට කඩන්නට දිනන්නට

♦ ආචාර්යා සුභද්‍රා සිරිවර්ධන
**Dr Subhadra Siriwardane - MA PhD London**

## හරස්පද ප්‍රහේලිකා 108




**හරහට :**
1 දෝෂාරෝපණය
5 කසාදයට තවත් නමකි
7 ගිනි ගොඩවල්
8 රැයේ බැබළේ
10 බාප්පා මෙසේද හැඳින්වේ

**පහළට :**
1 නුරුස්සන
2 මේවා බැඳුණු විට ඇස් නොපෙනේ
3 ඔක්සිජන් මෙයට අයත්ය
4 පරිගණකයට දාන කරුණු
6 හොඳම වයසට පැමිණි තැනැත්තා
10 ගෙඩි දෙකට කැපූ විට මේවා ලැබේ.

***ගියවර නිවැරදි විසඳුම්***

**හරහට :** 1 විනෝදය 4 පාන් 5 කාසි 7 කඩියා 9 ත්‍රාසය 11 මෙවලම්
**පහළට :** 1 විපාකය 2 නෝන්ඩි 3 යකා 6 සිතියම් 8 යාත්‍රාව 10 සල

### නේක රසෙන් පිරිපුන් සිංහල ඉවුම් පිහුම්

## අමු කෙසෙල්ගෙඩි ව්‍යංජනය
## Raw Banana Curry

*අළු කෙසෙල් ගෙඩි පමණක් නොව ඕනෑම වර්ගයක අමු කෙසෙල් ගෙඩි ව්‍යංජන සඳහා සුදුසුය. මේ එක් ක්‍රමයකි.*

***අවශ්‍ය ද්‍රව්‍ය :***

| | |
|---|---|
| අමු කෙසෙල්ගෙඩි | 4 යි |
| පොල්කිරි කෝප්ප | ½ යි |
| බැදපු නැති තුනපහ මේස හැඳි | 2 යි |
| අබ මේස හැඳි | ½ යි |
| බොම්බයි ළූණු ගෙඩි | 1 යි |
| සීනි මේස හැඳි | 1 යි |
| බදින එළවළු තෙල් | |
| කහ සහ ලුණු අවශ්‍ය පමණ | |
| දෙහි හෝ විනාකිරි ටිකක් | |

***සාදන ක්‍රමය :*** පිහියක් ගෙන කෙසෙල් ගෙඩි ලෙලිගසා ඉවත්කර සිහින් පෙති වලට කපා ගන්න. ඉන්පසු තෙල් ලිප තබා ඒ පෙති මඳක් රන්වන් පාට වන තුරු බැදගන්න. ඒ බැදුණු කෙසෙල් ගෙඩි පෙති තෙලෙන් ඉවතට ගෙන තුනී කඩදාසි මත තෙල් බේරී යන්නට විසුරුවන්න.

සාස්පානක් ගෙන ඊට තුනපහ, කහ, අබ, ලියාගත් ළූණු, සීනි, ලුණු, දෙහි හා පොල්කිරි ද දමා ලිප තබා හොඳින් හැඳිගාමින් උතුරවන්න. දැන් එයට පසෙක තැබූ බැදපු කෙසෙල් ගෙඩි පෙති එකතුකර විනාඩි තුනක් පමණ පිසගන්න.

♦ ***අයන්ති පීරිස්*** *නාත්තන්ඩිය* **Sri Lanka**

*මෙහි පළකිරීම සඳහා ඔබ දන්නා රසවත් කෑම වට්ටෝරු පත්‍රයේ **2** වන පිටුවේ ඇති ලිපිනයට අපට ලියා එවන්න .*


Sam's
CHICKEN CHICKEN CHICKEN
Great Tasting! Great Value!
සෑම්ස් චිකන්
17 HIGH STREET, WEALDSTONE, HARROW HA3 5BY, TEL: 020 8861 1872
439 HIGH ROAD, WILESDEN, LONDON NW10 2JJ, TEL: 020 8451 7662
84 HIGH STREET, HARLESDEN, LONDON NW10 42J, TEL: 020 8838 2036
246 KINGSBURY ROAD, KINGSBURY, LONDON NW9 9HN, TEL: 020 8204 1432